# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**6 ශ්‍රේණිය**

**පළමු වාරය - නර්තනය**

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.1 ශාරීරික නම්‍යතාවය සඳහා නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරයි. | * ශාරීරික නම්‍යතාවය සංවර්ධනය කරගැනීමට සුදුසු අභ්‍යාස තෝරා ගැනීම.<br>* නම්‍යතා අභ්‍යාස 04 ක් අභ්‍යාස කරයි.<br>* සංයුක්ත තැටි ආධාර කරගෙන අභ්‍යාස කරයි.<br>* නම්‍යතා අභ්‍යාස කිරීමේදී අනුගමනය කළයුතු විධි ක්‍රම, නිවැරදි ඉරියව්, අංගහාර හැඩතල චලන හා ශරීර අංග ක්‍රියාත්මක වන අයුරු සාකච්ඡා කරයි. | 02<br>පැ. 01 වි. 20 | ජනවාරි 01 සතිය |
| **02** | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.1 පරිසරයේ ස්වාභාවිකත්වය අගයමින් විවිධ නිර්මාණ ඉදිරිපත් කරයි. | * පරිසර නිරීක්ෂණයෙන් අත්දැකීම් ලබයි.<br>* පරිසර අසිරිය තේමා කරගත් ගීත ශ්‍රවණය කරයි.<br>* පරිසර නිරීක්ෂණයෙන් ලද අත්දැකීම් අනුව චලන අභ්‍යාස කරමින් නර්තනය කරයි.<br>* පරිසර අසිරිය පිළිබඳ කවි, ගීත නිර්මාණය කරයි. | 01<br>විනාඩි 40<br><br>02<br>පැ. 01 වි. 20<br>01<br>විනාඩි 40 | ජනවාරි 01 සතිය<br><br>ජනවාරි 02 සතිය<br><br>ජනවාරි 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **03** | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.2 පරිසරයෙන් ලබන අත්දැකීම් ඇසුරින් චලන නිර්මාණය කරයි. | * පිම්බීම, හැකිලීම ආදී ක්‍රියාකාරකම්වල අභ්‍යාස කරයි.<br>* බැලුම් සුළඟට සෙලවීම, මල් පොහොට්ටු පිබිදීම, පිපිණු මල් සුළඟට පැද්දීම ආදී තාලයට දක්වයි. | 02<br>පැ. 01 වි. 20 | ජනවාරි 03 සතිය |
| | | | * ස්වාභාවික පරිසරයේ දක්නට ලැබෙන සත්ව චරිතවල ගමන් විලාස සාකච්ඡා කරයි / නිරීක්ෂණය කරයි.<br>* ඉබ්බෙකු, හාවෙකු අලියකුගේ ගමන් චලන ඉරියව් අනුකරණය කරයි. | 01<br>විනාඩි 40 | ජනවාරි 03 සතිය |
| | | | * එම චලන සඳහා සංගීත ඛණ්ඩ හා බෙරපද භාවිත කරමින් නිර්මාණාත්මකව නර්තනය සිදු කරයි. | 01<br>විනාඩි 40 | ජනවාරි 04 සතිය |
| **04** | ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2.1නියමිත තිත් රූප හා නාදමාලා අනුගමනය කරමින් ගායනා ඉදිරිපත් කරයි. | * නැලවිලි කවි පිළිබඳ සාකච්ඡා කරයි.<br>* නැලවිලි කවි ශ්‍රවණය කිරීම.<br>* නිවැරදි නාද මාලාවට අනුව ගායනය<br>* සාමූහිකව හඬ පාලනය කරමින් ගායනය කරයි. | 01<br>විනාඩි 40 | ජනවාරි 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **05** | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.1 ශ්‍රීලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි සාරධර්ම අගයමින් අදහස් දක්වයි. | * ගුරු ගෙදර නර්තන අධ්‍යාපනය පිළිබඳ සාකච්ඡා කිරීම.<br>* ගුරු වන්දනා කවියක් ශ්‍රවණයට සැලැස්වීම හා ගායනය කරවීම.<br>* ගුරු ගෙදර අධ්‍යාපනය හා සබැඳි චාරිත්‍ර හා සාරධර්ම සාකච්ඡා කිරීම.<br>* සාරධර්ම ජීවිතයට වැදගත් වන ආකාරය සාකච්ඡා කිරීම. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | ජනවාරි 04 සතිය<br><br>පෙබරවාරි 01 සතිය |
| **06** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.2.I පාද චලන හුරු කරගැනීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කිරීම. | * නමස්කාර සරඹය හඳුන්වා දීම.<br>* නමස්කාර සරඹයෙහි අර්ථය සිසුන් සමඟ සාකච්ඡා කිරීම.<br>* ගුරු නමස්කාර ගාථාව ශ්‍රවණයට සැලැස්වීම සහ ගායනය.<br>* පදය කියමින් නමස්කාර සරඹය අභ්‍යාසයේ යෙදීම.<br>* නර්තනයේ මූලික ඉරියව්ව පිළිබඳ සාකච්ඡා කිරීම.<br>* පා සරඹ පද තාල තබමින් කීම හා නැටීම.<br>* හමාර පදය තාල තබමින් කීම හා නර්තනය කිරීම. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40<br><br>02<br>පැ. 01 වි. 20 | පෙබරවාරි 01 සතිය<br><br>පෙබරවාරි 01 සතිය<br><br>පෙබරවාරි 02 සතිය |
| **07** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම් විචාරයට ලක් කරයි. | 6.4.1විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි. | * තෛපොංගල් උත්සවය හා බැඳි පසුබිම සාකච්ඡා කරයි.<br>* තෛපොංගල් යන වචනය අර්ථ දක්වයි.<br>* තෛපොංගල් උත්සවයේ දෘශ්‍ය පටයක් නැරඹීම.<br>* චාරිත්‍ර විධි හා සැරසිලි පිළිබඳ සාකච්ඡා කරයි. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | පෙබරවාරි 02 සතිය<br><br>පෙබරවාරි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **08** | ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1 නියමිත ගායනාවල සංස්කෘතික පසුබිම විස්තර කරයි. | * නැලවිලි, ලී, කළගෙඩි, වන්නම් හි පසුබිම පිළිබඳ සාකච්ඡා කිරීම.<br>* නැලවිලි, ලී, කළගෙඩි, වන්නම් ගායනා ශ්‍රවණය කිරීමට සැලැස්වීම.<br>* නියමිත ගායනා සංරක්ෂණය කර ගැනීම පිළිබඳ යෝජනා සාකච්ඡා කරයි. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | පෙබරවාරි 03 සතිය<br><br>පෙබරවාරි 03 සතිය |
| **09** | ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.2.2.නියමිත තිත් රූප සහ නාදමාලා අනුගමනය කරමින් ගායනා ඉදිරිපත් කරයි. | * ලී කෙළි සහ කළගෙඩි කවි ශ්‍රවණයට සලස්වා එහි පසුබිම පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම විමසීම.<br>* ලී කෙළි කවි පදයට තාල තැබීමට යොමු කරවීම.<br>* සාමූහිකව ලී කෙළි කවි නියමිත නාද මාලාවට අනුව ගායනයට යොමු කරවීම.<br>* කළගෙඩි කවි පදයට තාල තැබීමට යොමු කිරීම.<br>* සාමූහිකව කළගෙඩි කවි නියමිත නාද මාලාවට අනුව ගායනයට යොමු කරවීම. | 02<br>පැ. 01 වි. 20 | පෙබරවාරි 04 සතිය |
| **10** | පුනරීක්ෂණ | | | 01<br>විනාඩි 40 | පෙබරවාරි 04 සතිය |
| **11** | ප්‍රායෝගික පුහුණුව/පරීක්ෂණය | | | 03<br>පැය 02 | මාර්තු 01 සතිය |
| **12** | ප්‍රායෝගික පුහුණුව (තරග) | | | 03<br>පැය 02 | මාර්තු 02 සතිය |
| **13** | පළමු වාර පරීක්ෂණය | | | 03<br>පැය 02 | මාර්තු 03 සතිය |

**දෙවන වාරය - නර්තනය**

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.4.1ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්‍ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි. | * කළගෙඩි නැටුමේ සුවිශේෂ ලක්‍ෂණ සාකච්ඡා කරයි.<br>* නැටුමට උචිත සරල පද නිර්මාණ කරයි.<br>* කළගෙඩි කවි ගයමින් නර්තනය කරයි.<br>* අවකාශය භාවිත කරමින් ප්‍රාසාංගික කළගෙඩි නර්තනයක් ඉදිරිපත් කරයි.<br>* සාමූහිකව කළගෙඩි නර්තනයේ යෙදෙයි. | 02<br>පැය 01වි. 20<br><br>01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | අප්‍රේල් 04 සතිය<br><br>අප්‍රේල් 04 සතිය<br><br>මැයි 01 සතිය |
| **02** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.3.1. සරඹ අභ්‍යාසයෙන් නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරයි. | * නිවැරදි අංගහාර සහිතව ගොඩ සරඹ නැරඹීමට සිසුන් යොමු කරයි.<br>* සරඹ පද ලය අනුව තාල තැබීමට හා කස්තිරම තාල තැබීම.<br>* බෙර වාදනයට අනුව 1,2 ගොඩ සරඹ පද විලම්භ, මධ්‍ය ලයට අනුව නර්තනය කරයි.<br>* සාමූහිකව සහ ඒකලව ගොඩ සරඹ අභ්‍යාස කරයි. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40<br><br>02<br>පැය 01වි. 20 | මැයි 01 සතිය<br><br>මැයි 01 සතිය<br><br>මැයි 02 සතිය |
| **03** | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.3. භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණ කරයි. | * උදැසන පරිසරයේ තිබෙන අසිරිය පිළිබඳ සාකච්ඡා කරයි.<br>* කුරුල්ලන්, මී මැස්සන්, හා පැටවුන්, මුව පොව්වන්, සමනලයින් වැනි සත්ව චරිතවල ස්වභාවය පිළිබඳ සාකච්ඡා කරයි.<br>* සතුන්ගේ චරිත ස්වභාවය භාව ප්‍රකාශනය වන අයුරින් නර්තන නිර්මාණයට යොමු කරයි. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | මැයි 02 සතිය<br><br>මැයි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **04** | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.1 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | * සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ නිරීක්ෂණයට සිසුන් යොමු කරයි.<br>* සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ සඳහා භාවිත කරන අමුද්‍රව්‍ය හා විකල්ප වාද්‍ය භාණ්ඩ නිර්මාණය කරන අයුරු සාකච්ඡා කරයි.<br>* සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය භාණ්ඩයන්හි ශබ්ද සහ නාද පිළිබඳ සාකච්ඡා කරයි. | 01<br>විනාඩි 40<br><br><br><br><br>01<br>විනාඩි 40 | මැයි 03 සතිය<br><br><br><br><br><br>මැයි 03 සතිය |
| **05** | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ සහ විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.2. විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරයි. | * විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගැනීම.<br>* උපකරණ නිර්මාණය සඳහා සුදුසු ද්‍රව්‍ය තෝරා ගැනීම. (කලින් දෙන ලද)<br>* විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණයට යොමු කිරීම.<br>* එම වාද්‍ය උපකරණ ප්‍රදර්ශනය කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබාදීම.<br>* විකල්ප වාද්‍ය උපකරණ වාදනය කළහැකි අවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම හා වාදනය කරමින් සතුටක් ලැබීම. | 02<br>පැය 01 වි. 20<br><br><br><br><br><br>01<br>විනාඩි 40 | මැයි 01 සතිය<br><br><br><br><br><br><br>මැයි 04 සතිය |
| **06** | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමයන් රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.2. ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන්වල තොරතුරු ඉදිරිපත් කරයි. | * ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් පිළිබඳ සාකච්ඡා කර නම් කරයි.<br>* ප්‍රචලිත ප්‍රදේශ ලංකා සිතියමක ලකුණු කරයි.<br>* ප්‍රධාන වාද්‍ය භාණ්ඩ, රංග වස්ත්‍රාභරණ පිළිබඳ රූප සටහන් ඉදිරිපත් කරයි.<br>* ප්‍රධාන ශාන්තිකර්ම නම් කර ඒ පිළිබඳ සාකච්ඡා කරයි.<br>* සම්ප්‍රදායන්වල ප්‍රධාන අංගහාර ඇතුළත් සරල නර්තන කොටසක් ඉදිරිපත් කරයි.<br>* නර්තන සම්ප්‍රදායන් රැක ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරයි. | 02<br>පැය 01 වි. 20 | ජුනි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **07** | ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.3 නියමිත තිත් රූප සහ නාදමාලා අනුගමනය කරමින් ගායනා ඉදිරිපත් කරයි. | * නියමිත නාද මාලාවට අනුව හනුමා වන්නම ගායනා කරයි.<br>* බෙර පද තාල තබමින් කියයි.<br>* සාමූහිකව හා ඒකලව වන්නම ගයයි.<br>* සතුටින් ගායනය ඉදිරිපත් කරයි. | 01<br>විනාඩි 40 | ජුනි 01 සතිය |
| **08** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම් විචාරයට ලක් කරයි. | 6.4. විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි. | * වෙසක් උත්සවය පිළිබඳ තොරතුරු සාකච්ඡා කරයි.<br>* වෙසක් උත්සවය පැවැත්වීමේ හේතු සහ නර්තන, ගායන, වාදන, සැරසිලි අංග පිළිබඳ සාකච්ඡා කරයි.<br>* මෙම උත්සවය හා බැඳි වත් පිළිවෙත් වල යෙදීමෙන් මානසික සතුටක් ලබයි.<br>* වෙසක් සැරසිල්ක් නිර්මාණය කිරීමෙන් සතුටක් ලබයි. | 02<br>පැය 01 වි. 20 | ජුනි 02 සතිය |
| **09** | විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.1. නිර්දේශිත ගීතයට සවන්දී එහි සුවිශේෂතා සාකච්ඡා කරමින් අදහස් ඉදිරිපත් කරයි. | * නිර්දේශිත ගීතයට සවන් දීම.<br>* ගීතයේ පද රචනය, ගායනය හා සංගීත නිර්මාණය පිළිබඳ සාකච්ඡා කරයි.<br>* ගීතයේ අන්තර්ගත සිද්ධීන් සාකච්ඡා කරයි.<br>* මගෙ පොඩි යාළු/පාන්දරින් ඉස්කෝලෙට ගීතය ගායනා කරයි. | 01<br>විනාඩි 40<br>01<br>විනාඩි 40 | ජුනි 02 සතිය<br>ජුනි 03 සතිය |
| **10** | විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.2. ගීත අනුව නර්තන නිර්මාණය කරයි. | * තෝරාගත් ගීතය ගායනය කරයි.<br>* තෝරාගත් ගීතයට උචිත චලන නිර්මාණය කරයි.<br>* අවකාශය භාවිතා කරමින් සාමූහිකව නර්තනයේ යෙදෙයි.<br>* නිර්මාණය කරන ලද නර්තනය සතුටින් ඉදිරිපත් කරයි. | 01<br>විනාඩි 40<br>01<br>විනාඩි 40<br>01<br>විනාඩි 40 | ජුනි 03 සතිය<br>ජුනි 03 සතිය<br>ජුනි 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **11** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.2 වෙනත් සංස්කෘතීන්ට අයත් නර්තන අංගවල අනන්‍යතා ලක්ෂණ ඉදිරිපත් කරයි. | * ද්‍රවිඩ ගැමි නැටුම් පිළිබඳ සාකච්ඡා කරයි.<br>* ද්‍රවිඩ ගැමි නැටුම්වල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>* සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් අතර ඇති සමාන අසමානතා සාකච්ඡා කරයි. | 01 විනාඩි 40<br>01 විනාඩි 40<br>01 විනාඩි 40 | ජුනි 04 සතිය<br>ජුනි 04 සතිය<br>ජුලි 01 සතිය |
| **12** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.3. වෙනත් සංස්කෘති හා සබැඳි නර්තන අංගයක් ප්‍රදර්ශනය කරයි. | * චෙම්බු, කෝලාට්ටම් නර්තන අංගයක් ප්‍රදර්ශනය කිරීම.<br>* චෙමුබු, කෝලාට්ටම් නර්තන අංග සඳහා සුදුසු ගීත ශ්‍රවණය කරයි.<br>* රංග උපකරණ නිසි පරිදි භාවිත කරමින් සතුටින් පද නර්තනය කරයි.<br>* කණ්ඩායම් වශයෙන් නර්තනය ඉදිරිපත් කරයි. | 01 විනාඩි 40<br>01 විනාඩි 40<br>01 විනාඩි 40 | ජුලි 01 සතිය<br>ජුලි 01 සතිය<br>ජුලි 02 සතිය |
| **13** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.5. සාම්ප්‍රදායික චලන භාවිතා කරමින් අලංකාර පද නිර්මාණය කරයි. | * සාම්ප්‍රදායික නර්තන අංගයක් ප්‍රදර්ශනය කරයි.<br>* සම්ප්‍රදාය හා සබැඳි චලනවල අනන්‍යතා ලක්ෂණ සාකච්ඡා කරයි.<br>* අලංකාර පද 02 ක් නිර්මාණයට යොමු කරයි. (සුළු තනි තිත)<br>* සුළු තනි තිතට අදාළව ගොඩනගන ලද අලංකාර පද දෙක ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම. | 01 විනාඩි 40<br>01 විනාඩි 40 | ජුලි 02 සතිය<br>ජුලි 02 සතිය |
| **14** | ප්‍රායෝගික පරීක්ෂණ | | | 03 පැය 02 | ජුලි 03 සතිය |
| **15** | දෙවන වාර පරීක්ෂණ | | | | |

## තුන්වන වාරය - නර්තනය

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| 01 | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.4.2ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි. | * බෙරවාදනය අනුව ලී කෙළි කවි ගායනය කරයි.<br>* ලී කෙළි නැටුමට උචිත සරල අලංකාර පද නිර්මාණය කරයි. | 02<br>පැය 01 වි. 20 | සැප්තැම්බර් 01 සතිය |
| | | | * අවකාශ භාවිතය හා රංග රටා යොදා ගනිමින් අලංකාර මාත්‍රා අභ්‍යාස කරයි. | 01<br>විනාඩි 40 | සැප්තැම්බර් 01 සතිය |
| | | | * කණ්ඩායම් හැඟීමෙන් යුතුව සතුටින් නර්තනයේ යෙදෙයි.<br>* නිමාවක් සහිත ලී කෙළි නැටුමක් ඉදිරිපත් කරයි. | 01<br>විනාඩි 40 | සැප්තැම්බර් 02 සතිය |
| 02 | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.4.1නර්තනයේදී සිරුර හසුරුවන ආකාරය විස්තර කරයි. | * අංග, ප්‍රත්‍යංග, උපාංග හඳුනා ගනියි.<br>* ඒවා හසුරුවන ආකාරය සාකච්ඡා කරයි.<br>* නර්තනයෙහි චමත්කාරය දනවීමට අංග ප්‍රත්‍යංග උපාංගයන්ගේ ක්‍රියාකාරිත්වයෙහි වැදගත්කම හඳුනාගනියි.<br>* නර්තනයේ යෙදෙමින් අලංකාර මාත්‍රා අභ්‍යාස කරමින් අංග, ප්‍රත්‍යංග, උපාංග හසුරුවන ආකාය නිරීක්ෂණය කරයි.<br>* සංගීත ඛණ්ඩයට අනුව නර්තන නිර්මාණය තුළින් සිරුර ක්‍රියාකරන අයුරු නිරීක්ෂණය කරයි. | 01<br>විනාඩි 40 | සැප්තැම්බර් 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **03** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.6.1 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | * හනුමා වන්නමේ බෙර පදය තාල තබමින් කියයි.<br>* බෙර වාදනයට අනුව කවි ගායනය කරයි.<br>* කස්තිරම තාල තබා කියයි.<br>* නියමිත අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව ගයමින් නර්තනය කරයි.<br>* ඒකලව හා සමූහ ලෙස අභ්‍යාස කරයි. | 02<br>පැය 01 වි. 20<br><br>01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | සැප්තැම්බර් 03 සතිය<br><br>සැප්තැම්බර් 03 සතිය<br><br>සැප්තැම්බර් 04 සතිය |
| **04** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.7.1 විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. | * මාත්‍රා 2 තනි තිතට යෙදෙන කවියක් ගායනා කරයි.<br>* ප්‍රස්තාරකරණයෙහි විධි ක්‍රම පිළිබඳ සාකච්ඡා කරයි.<br>* තිත්, සංඥා ලකුණු, විභාග මාත්‍රා යොදන අයුරු විස්තර කරයි.<br>* රබන් පද, බෙර පද, ලී කෙළි කවි ප්‍රස්තාර කරයි. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40<br>01<br>විනාඩි 40 | සැප්තැම්බර් 04 සතිය<br><br>සැප්තැම්බර් 04 සතිය<br><br>ඔක්තෝම්බර් 04 සතිය |
| **05** | සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.3.1 විකල්ප වාද්‍ය උපකරණ භාවිත කරමින් ශබ්ද සහ නාද නිපදවීම. | * විකල්ප වාද්‍ය උපකරණ ලබාදී සිසුන්ගේ අභිමතය පරිදි වාදනය කිරීමට අවස්ථාව ලබාදීම.<br>* තනි තිතේ තාල රූපයට නිපදවිය හැකි ශබ්ද සහ නාද හඳුනාගැනීම.<br>* සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය භාණ්ඩ යොදා ශබ්ද සහ නාද නිපදවයි.<br>* සහයෝගයෙන් යුතුව වාදනය කරයි. | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40 | ඔක්තෝම්බර් 01 සතිය<br><br>ඔක්තෝම්බර් 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **06** | සම්ප්‍රදායික වාදන භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.4.1 තේමාවට අනුව සමූහ වාදන ප්‍රදර්ශනය කරයි. | * දුම්රිය ක්‍රියාකාරීත්වය ඇතුළත් සංයුක්ත තැටියක් / ඒ හා සම්බන්ධ ගීතයක් ශ්‍රවණය කරයි.<br>* ඒ අනුව යොදා ගත හැකි ශබ්ද හා නාද වලට අදාළ සම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය භාණ්ඩ තෝරයි.<br>* තේමාවට උචිත ශබ්ද සහ නාද ඇසුරින් සමූහ වාදනයක් නිර්මාණය කරයි.<br>* ප්‍රාසාංගිකව සමූහ වාදනයක් ඉදිරිපත් කරයි. | 02<br>පැය 01 වි. 20 | ඔක්තෝම්බර් 02 සතිය |
| **07** | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.3.1 ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | * නිත්තවෙල ගුණයා, එන්.ඒ. සිරිබෝහාමි හා සව්රිස් සිල්වා යන ශිල්පීන්ගේ පින්තූර හඳුනා ගනී.<br>* එම ශිල්පීන්ගේ ජීවන තොරතුරු පිළිබඳ සාකච්ඡා කරයි.<br>* එම ශිල්පීන්ගේ සේවය අගයමින් අදහස් දක්වයි. | 02<br>පැය 01 වි. 20 | ඔක්තෝම්බර් 03 සතිය |
| **08** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂ ලක්‍ෂණ විචාරයට ලක් කරයි. | 6.1.1 සබරගමු සමන් දේවාල පෙරහැර හා සබැඳි පසුබිම අධ්‍යයනය කරමින් එහි සුවිශේෂ ලක්‍ෂණ විචාරයට ලක් කරයි. | * සමන් දේවාල පෙරහැර හා සම්බන්ධ ඓතිහාසික තොරතුරු සාකච්ඡා කරයි.<br>* පැවැත්වීමේ හේතු, චාරිත්‍ර විධි නම් කරයි.<br>* පෙරහැරේ දක්නට ලැබෙන නර්තන වාදන අංග හා විශේෂාංග පිළිබඳ අදහස් දක්වයි. | 01<br>විනාඩි 40<br>02<br>පැය 01 වි. 20 | ඔක්තෝම්බර් 01 සතිය<br>ඔක්තෝම්බර් 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිම කළයුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **09** | විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | 7.3.1සරල සැරසිලි අංගයක් නිර්මාණය කරයි. | * ගොක් කොළ යොදාගෙන කරන ලද සැරසිලි පිළිබඳ සාකච්ඡා කරයි.<br>* රූං පෙත්තක්, ගොක් කොළ නලාවක් සාදා සතුටු වෙයි.<br>* සැරසිලිවලට අවශ්‍ය අමුද්‍රව්‍ය තෝරා ගනියි.<br>* සිසුන්ට පෙනෙන සේ පිහිය අල්ලන ආකාරය, ගොක් කොළ කපන ආකාරය නිරීක්ෂණයට ඉඩ සලසයි.<br>* ගොක් සැරසිල්ලක් නිර්මාණය කරයි.<br>* එම සැරසිලි ප්‍රදර්ශනය කර සතුටක් ලබයි. | 01<br>විනාඩි 40<br><br>02<br><br>01 | ඔක්තෝම්බර් 04 සතිය<br><br>නොවැම්බර් 01 සතිය<br><br>නොවැම්බර් 01 සතිය |
| **10** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම් විචාරයට ලක් කරයි. | 6.4.3 විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි. | * නත්තල් උත්සවය හා බැඳි ගීතයක් ශ්‍රවණය කරයි.<br>* එම ගීතයේ පද කිහිපයක් ගායනා කරයි.<br>* නත්තල් උත්සවය හා සබැඳි ආගමික වත් පිළිවෙත් පිළිබඳ සාකච්ඡා කරයි.<br>* එම උත්සවයේ චාරිත්‍ර හා සැරසිලි පිළිබඳ විස්තර කරයි.<br>* නත්තල සඳහා සුභ පැතුම් පතක් නිර්මාණය කරයි, සතුටු වෙයි. | 02<br>පැය 01 වි. 20 | නොවැම්බර් 02 සතිය |
| **11** | පුනරීක්ෂණය | | | 01 | නොවැම්බර් 02 සතිය |
| **12** | ප්‍රායෝගික පරීක්ෂණ | | | 03 | නොවැම්බර් 03 සතිය |
| **13** | වාර පරීක්ෂණ | | | | |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ ඉතිහාසය විෂය අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**

**6 ශ්‍රේණිය**

**පළමු වාරය - නර්තනය**

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **01** | නර්තනය හා බැඳුණු මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | නමස්කාර අභ්‍යාසයේ යෙදෙමු. | පියවර ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතනයේ සරඹ අභ්‍යාස CD පටය පරිශීලනය | CD පටයේ සංගීත ඛණ්ඩයක් උපයෝගී කර ගනිමින් නමස්කාර අභ්‍යාස උපයෝගී කර රංගනයක් නිර්මාණය කරන්න. | නමස්කාර අභ්‍යාස 2 ක් නිවැරදිව ඉදිරිපත් කිරීම වෙනුවෙන් ලකුණු පිරිනැමීම. |
| **02** | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | පරිසර සුන්දරත්වය අගයමු | ගවේෂණ ක්‍රමය | පරිසර නිරීක්ෂණය තුළින් පරිසර සුන්දරත්වය ඉගෙනීමට යොමු කිරීම | පරිසර නිරීක්ෂණය අත්දැකීම් කර ගනිමින් සිතුවම්, කවි, ගීත නිර්මාණය කරන්න. | වාචිකව සිදු කරයි. |
| **03** | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | අපි විවිධ චලන නිර්මාණය කරමු | පියවර ක්‍රමය, කණ්ඩායම් ක්‍රමය | පරිසරයේ විවිධ චරිත නිරීක්ෂණයට යොමු කිරීම. | චරිත කිහිපයක් ඇතුළත් කථාවක් ගොඩනගන්න.<br>එම කතාව විවිධ චලන ඇසුරින් ඉදිරිපත් කරන්න. | දෙන ලද චරිත ආශ්‍රයෙන් එම චරිතවල ගමන් විලාස, චලන ඉදිරිපත් කිරීමේ ස්වභාවය සඳහා ලකුණු පිරිනැමීම. |
| **04** | ශ්‍රීලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනා කුසලතා ප්‍රදර්ශනය කරයි. | නැලවිලි කවි ගයා රස විඳිමු | ප්‍රායෝගික ක්‍රමය | සුදත් සමරසිංහ මහතාගේ නැලවිලි ගී තැටිය ශ්‍රවණය කිරීම | වෙනත් නැලවිලි ගී එකතු කරමින් පොත් පිංචක් නිර්මාණය කරන්න. | සාමූහික වශයෙන් නැලවිලි කවි ලයාන්විතව නිවැරදි නාද මාලාවට අනුව ගායනය කරයි. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **05** | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියාකරයි. | ගුරු ගෙදර හා සබැඳි සාරධර්ම සුරකිමු. | අනුකරණ ක්‍රමය | ජාතික අ. ආයතනයේ අතිරේක කියවීම් පොත | * ගුරු වන්දනා ගාථාව සාමූහිකව ගායනා කරන්න.<br>* ගුරු ගෙදර නර්තන අධ්‍යාපනය හා බැඳි සාරධර්ම 10 ක් ලියන්න. | ගුරු ගෙදර නර්තන අධ්‍යාපනය හා බැඳි සාරධර්ම පිළිබඳ අදහස් දක්වයි. |
| **06** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශය කරයි. | නැටුමට අවසර ගෙන පාද තබමු. | අනුකරණ ක්‍රමය | ජාතික අ. ආයතනයේ සරඹ අභ්‍යාස CD පටය නැරඹීමට යොමු කිරීම. | කණ්ඩායම් වශයෙන් මණ්ඩිය, නිවැරදි ඉරියව්, අංගහාර අනුකරණය කරමින් පා සරඹ ඉදිරිපත් කිරීම. | 1, 2, 3 යන පා සරඹවලින් එකක් නර්තනයට යොමු කර ලකුණු ලබාදීම. |
| **07** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | තෛපොංගල් උත්සවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමු. | සාකච්ඡා ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය | ජාතික අ. ආයතනයේ අතිරේක කියවීම් පොත පරිශීලනය. | තෛපොංගල් උත්සවය පිළිබඳ කරුණු ගවේෂණය කොට බිත්ති පුවත් පතකට ලිපියක් ලියන්න. | * තෛපොංගල් උත්සවය පැවැත්වෙන මාසය නම් කරයි.<br>* තෛපොංගල් වචනයේ අර්ථය ප්‍රකාශ කරයි.<br>* තෛපොංගල් උත්සවය හා බැඳි චාරිත්‍ර නම් කරයි. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **08** | ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | ශ්‍රී ලාංකේය ජන ගායනා හඳුනා ගනියි. | සාකච්ඡා ක්‍රමය | ජන ගායනාවල සංස්කෘතික පසුබිම ලියවී ඇති ග්‍රන්ථ පරිශීලනය | ජන ගායනාවල තොරතුරු රූප සටහන් ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න. | * නැලවිලි කවි ගායනය පිළිබඳ අගයමින් වාක්‍ය 2 ක් ලියයි.<br>* කළගෙඩි, ලී කෙළි කවි අසන්නට ලැබෙන අවස්ථා නම් කරයි. |
| **09** | ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | ලී කෙළි සහ කළගෙඩි කවි ගයමු. | අනුකරණ ක්‍රමය | කාන්ති ශිල්පාධිපති මහත්මියගේ හෙළ ජන ගී තැටිය ශ්‍රවණය කිරීම / අන්තර්ජාලය පරිශීලනය. | කණ්ඩායම් වශයෙන් නිවැරදි නාද මාලාවට අනුව කළගෙඩි, ලී කෙළි කවි ගායනා කරන්න. | * ලී කෙළි සහ කළගෙඩි කවි ගායනාවල සුවිශේෂ ලක්ෂණ<br>* කළගෙඩි, ලී කෙළි කවි නිවැරදි නාද මාලාවට අනුව ගායනා කරයි. |

## දෙවන වාරය - නර්තනය

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **01** | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | කළගෙඩි නැටුම නර්තනයට එක්වෙමු. | පියවර ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය, අනුකරණ ක්‍රමය | අන්තර්ජාලය උපයෝගී කරගනිමින් කළගෙඩි නර්තනයක් නැරඹීමට යොමු කිරීම. | නිමාවකින් යුතු කළගෙඩි නර්තනයක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න. | නිමාවකින් යුතු කළගෙඩි නර්තනයක් කණ්ඩායම් වශයෙන් නිර්මාණය කර ඉදිරිපත් කරයි. |
| **02** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | සාම්ප්‍රදායික නර්තනයට හුරු වෙමු. (ගොඩසරඹ 1 - 2) | පියවර ක්‍රමය, අනුකරණ ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතනයේ සරඹ අභ්‍යාස CD පටය නැරඹීමට යොමු කිරීම. | නිවැරදි අංගහාර අනුගමනය කරමින් ගොඩ සරඹ 1-2 කස්තිරම් සමග නර්තනය කරන්න. | * ගොඩ සරඹ 1-2 විලම්භ මධ්‍ය ලය අනුව තාල් තබා කියයි.<br>* විලම්භ මධ්‍ය ලය අනුව ගොඩ සරඹ 1-2 කස්තිරම් සමග නර්තනය කරයි. |
| **03** | පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | චරිත නිරූපණයේදී සතුට ප්‍රකාශ කරයි. | භූමිකා රංගන ක්‍රමය, අනුකරණ ක්‍රමය | අන්තර් ජාලය/ වීඩියෝ පට නැරඹීමට යොමු කිරීම | සතුට නිරූපණය කිරීමට හැකි පරිසරයේ අසිරිය පිළිබඳ ගීතයකට නර්තනයක් නිර්මාණය කරන්න. | සතුට ප්‍රකාශ වන පරිදි සිද්ධි සහ චරිත නිරූපණය කරයි. |
| **04** | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ සහ විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමු. | සාකච්ඡා ක්‍රමය | අන්තර්ජාලය / වීඩියෝ පට නැරඹීමට යොමු කිරීම. | විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණයට යොදා ගත හැකි අමුද්‍රව්‍ය නම් කරන්න. | * සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ නම් කරයි.<br>* විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරයි. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **05** | සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | විකල්ප වාද්‍ය උපකරණ නිර්මාණය කරමු. | පියවර ක්‍රමය | අන්තර්ජාලය ඇසුරින් හෝ ජා. අ. ආයතනයේ සමූහ වාදය CD තැටි. | ශබ්ද හා නාද නිපදවිය හැකි විකල්ප වාද්‍ය භාණ්ඩ 2 ක් නිර්මාණය කරන්න. | කණ්ඩායම් ලෙස නිර්මාණය කළ විකල්ප වාද්‍ය උපකරණ සඳහා ලකුණු පිරිනමයි. |
| **06** | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියාකරයි. | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හඳුනා ගනිමු. | සාකච්ඡා ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය | * ජේ.ඊ. සේදරමන් මහතාගේ උඩරට නැටුම් කලාව, මුදියන්සෙ දිසානායක මහතාගේ උඩරට නර්තන කලාව<br>* අන්තර්ජාලය/ වීඩියෝ පට නැරඹීමට යොමු කිරීම | ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් පිළිබඳව ප්‍රශ්න 10 බැගින් සාදන්න.<br>දේශීය නර්තන සම්ප්‍රදායන්හි තොරතුරු ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරන්න. | වාචිකව පාඩම සංවර්ධනය කරන අවස්ථාවේ ඇගයීම සිදු කරයි. |
| **07** | ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | වන්නම් ගායනය ඉදිරිපත් කරමු. | පියවර ක්‍රමය, අනුකරණ ක්‍රමය | වන්නම් ගායනා ඇතුළත් කාන්ති ශිල්පාධිපති මහත්මියගේ වන්නම් 18 CD පටය ශ්‍රවණයට යොමු කිරීම. | හනුමා වන්නමේ නියමිත නාද මාලාවට අනුව ගායනය කරන්න. | ප්‍රායෝගිකව සිසුන් වන්නම තනි තනිව නිවැරදි නාද මාලාවට අනුව ගායනය කිරීමට සලස්වමින් ඇගයීම සිදු කරයි. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **08** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | වෙසක් උත්සවය පිළිබඳ තොරතුරු විස්තර කරමු. | සාකච්ඡා ක්‍රමය | වෙසක් උත්සවය පිළිබඳ ලියවී ඇති පුවත්පත් ලිපි/ රූපවාහිනී වැඩසටහන්/ ශ්‍රව්‍ය පට | වෙසක් උත්සවය හා සබැඳි සැරසිලි අංගයක් නිර්මාණය කරන්න. | වෙසක් උත්සවයේ ආගමික වටිනාකම විස්තර කරයි. |
| **09** | විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | ගීත අසමු රස විඳිමු | ප්‍රායෝගික ක්‍රමය, අනුකරණ ක්‍රමය | ගීත ඇතුළත් CD පට | ගීත ගායනයෙන් පසු නිවැරදි නාද මාලාවට අනුව ගායනයට හුරුවන්න. | අදාළ ගීතයේ පද රචනය/ සංගීත නිර්මාණය/ ගායනය යන ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට සලස්වා ඇගයීම සිදු කරයි. |
| **10** | විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | එක් වී ගීතයට නටමු | පියවර ක්‍රමය, අනුකරණ ක්‍රමය | අන්තර්ජාලය හා වීඩියෝ පට නැරඹීමට යොමු කිරීම | ගීතයට අනුව සුදුසු නර්තනයක් නිර්මාණය කරන්න. | සුදුසු චලන යොදා ගීතයට අනුව නර්තනයක් නිර්මාණය කර ඉදිරිපත් කරයි. |
| **11** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | සෙම්බු, කෝලාට්ටම් නර්තන හඳුනාගනිමු. | සාකච්ඡා ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතනයේ ද්‍රවිඩ ගැමි නර්තන පිළිබඳ CD තැටිය | සිංහල ගැමි නැටුම්වලට සමාන ද්‍රවිඩ ජන නැටුම් පිළිබඳ තොරතුරු එක්රැස් කොට ලිපියක් සකස් කරන්න. | කෙටි ලිඛිත පාඩම අවසානයේ දෙන ලද ප්‍රශ්නවලට අනුව ඇගයීම සිදු කරයි. |
| **12** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | චෙම්බු/ කෝලාට්ටම් නර්තන අංගයක් නිර්මාණය කර ඉදිරිපත් කරමු. | පියවර ක්‍රමය අනුකරණ ක්‍රමය නිරීක්ෂණ ක්‍රමය | ජා.අ. ආයතනයේ ද්‍රවිඩ ගැමි නර්තන පිළිබඳ CD තැටිය. | නිමැවකින් යුතු චෙම්බු/ කෝලාට්ටම් නර්තනයක් සාමූහිකව ඉදිරිපත් කරන්න. | සිංහල ගැමි නැටුම්වල හා ද්‍රවිඩ ගැමි නැටුම්වල නර්තන ශෛලීන්හි වෙනස්කම් පිළිබඳ සාකච්ඡා කරයි. |
| **13** | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | බෙරහඬ මැද්දේ නටමු පද සිත්සේ | පියවර ක්‍රමය, අනුකරණ ක්‍රමය | ජාතික අ. ආයතනයේ සරඹ අභ්‍යාස CD පටය නැරඹීමට යොමු කිරීම. | සාමූහිකව ගොඩ නගන ලද තිතට අදාළ මාත්‍රා නර්තනය කරන්න. | සාම්ප්‍රදායික චලන යොදා බෙර වාදනයට අනුව තනි තිතට අදාළ පද 02 ක් නර්තනය කරයි. |

## තුන්වන වාරය - නර්තනය

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| 01 | පරිසරය නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි. | ලී කෙළි නැටුමක් නිර්මාණය කරමු. | පියවර ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය | අන්තර්ජාලය ඇසුරු කර ගනිමින් හා සමස්ත ලංකා නර්තන තරගාවලියේ උරුමය නාලිකාවේ CD පට | ලීකෙළි නර්තනයක් නිර්මාණය කර සාහිත්‍ය සමිතියට ඉදිරිපත් කරන්න. | කණ්ඩායම් ලෙස නිර්මාණය කළ ලී කෙළි නර්තනය ඉදිරිපත් කිරීමට සලස්වා ඇගයීම් සිදු කරයි. |
| 02 | නර්තනය හා බැඳුණු මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | නර්තනයේදී සිරුර කෙසේ හසුරවන්නේ දැයි විමසමු | වියවර ක්‍රමය, සාකච්ඡා ක්‍රමය | ගීත ඇතුළත් CD තැටි ජාතික අධ්‍යාපන ආයතනයේ පා හරඹ CD තැටිය | නර්තනයේදී අංග ප්‍රත්‍යාංග උපාංග හසුරවන ආකාරය දක්වීමට නර්තන අංගයක් නිර්මාණය කරයි. | කණ්ඩායම් ක්‍රියාකාරකම් සිදුකර ලිඛිතව ඇගයීම සිදු කරයි. |
| 03 | නර්තනය හා බැඳුණු මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | වන්නම් ගයමින් නටමු. | පියවර ක්‍රමය, අනුකරණ ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතනයේ ගොඩ හරඹ CD තැටිය.<br>කාන්ති ශිල්පාධිපති මහත්මියගේ 18 වන්නම් ගී තැටිය. | නියමිත අංගහාර සහිතව හනුමා වන්නම නිර්මාණය කර සාහිත්‍ය සමිතියට ඉදිරිපත් කරන්න. | හනුමා වන්නම නර්තනය කරන අවස්ථාවේදී ඇගයීම සිදු කරයි. |
| 04 | නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | ප්‍රස්තාරකරණයේ යෙදෙමු. | පියවර ක්‍රමය | ප්‍රස්තාරකරණය පිළිබඳ ලියැවුණු පොත්පත් | තනිතිතේ ප්‍රභේදවලට අදාළ වන්නමක තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව ප්‍රස්තාර කරන්න. | ලිඛිතව ප්‍රස්තාරකරණයේ යෙදෙන අවස්ථාවේ ඇගයීම සිදු කරයි. |

| අනු අංකය | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් හා තක්සේරුකරණය ආකෘති / ප්‍රශ්න පත්‍ර |
|---|---|---|---|---|---|---|
| **05** | සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | වාදනයේ ශබ්ද හා නාද උපදවමු. | නිරීක්ෂණ ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය, පියවර ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතනයේ සමූහ වාදන CD පටය | නිර්මාණය කර ගත් විකල්ප වාද්‍ය උපකරණ ඇසුරින් විවිධ නාද උත්පාදනය කරන්න. | තනි තිතේ තාල රූප අනුව නිපදවිය හැකි ශබ්ද හා නාද පිළිබඳ සාකච්ඡා කරයි. |
| **06** | සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | ශබ්ද හා නාද මුසුකරමින් මවමු දුම්රියක් | පියවර ක්‍රමය, අනුකරණ ක්‍රමය, ප්‍රායෝගික ක්‍රමය | ජාතික අධ්‍යාපන ආයතනයේ සමූහ වාදන CD තැටිය. | පන්ති කාමරයේදී නිර්මාණය කරන ලද වාදනය හොඳින් පුහුණු වී සාහිත්‍ය සමිතියට ඉදිරිපත් කරන්න. | ප්‍රායෝගිකව විකල්ප වාදනය ඇසුරින් ඇගයීම සිදුකරයි. |
| **07** | ශ්‍රී ලාංකිය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුමයන් රැක ගැනීම සඳහා ක්‍රියා කරයි. | නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූවන් අගයමු. | සාකච්ඡා ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය | ඥානසිරි පීරිස් මහතාගේ නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූවන් පොත පරිශීලනය | දේශීය නර්තන කලාවට දායක වූ ශිල්පීන් පිළිබඳ තොරතුරු ගවේෂණය කර පොත් පිංචක් නිර්මාණය කරන්න. | ලිඛිතව දෙන ලද ප්‍රශ්න ඇසුරින් ඇගයීම සිදුකරයි. |
| **08** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි. | සමන් දේවාල පෙරහැර අසිරිය පවසමු. | සාකච්ඡා ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය | අන්තර්ජාලයේ තොරතුරු පුවත්පත්වල තිබූ විශේෂාංග ලිපි. | සමන් දේවාල පෙරහැර පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියක් සකසන්න. | දෙන ලද ප්‍රශ්න ඇසුරින් ඇගයීම සිදු කරයි. |
| **09** | විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි. | ගොප්කලා අංගයක් නිර්මාණය කරමු. | පියවර ක්‍රමය නිරීක්ෂණ ක්‍රමය | අන්තර්ජාලය ඇසුරින් | ගොප් කලා නිර්මාණ හැකිතාක් කරන්න. | කේවලව සිසුන් කරනු ලබන නිර්මාණය ඇගයීමට ලක් කරයි. |
| **10** | රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම් විචාරයට ලක් කරයි | නත්තල් උත්සවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරමු. | සාකච්ඡා ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය | රූපවාහිනී වැඩ සටහන්, පුවත්පත් ලිපි, අන්තර්ජාලය | නත්තල් උත්සවය පිළිබඳ උදෑසන රැස්වීමට කතාවක් ඉදිරිපත් කරන්න. | පාඩම අවසානයේ ප්‍රශ්න ඇසුරින් ඇගයීම සිදු කරයි. |